**සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ සහ එහි පරිපාලිතයන් - 2022**

------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ සමාගම සහ සමූහය නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මගහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍යප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- සමාගමේ සහ සමූහයේ යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම සහ සමූහය ක්‍රියාකර ඇති බව,

- සමාගමේ සහ සමූහයේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගමේ සහ සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම**

**1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතයෙහි 20 ඡේදයට අනුව, වක්‍ර ක්‍රමය යටතේ, මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය මුදල් නොවන අයිතමවල බලපෑම සඳහා ලාභ හෝ අලාභය ගැලපීමෙන් තීරණය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් විශ්‍රාම ප්‍රතිලාභ වෙනස් කිරීම මුදල් නොවන අයිතමයක් ලෙස ගලපනු වෙනුවට කාරක ප්‍රාග්ධන වෙනස්කම් යටතේ රු. 672,891 ක් ලෙස ගැලපීම් කර තිබුණි. | මෙම දෝෂය හඳුනාගෙන ඇති අතර ඒ අනුව ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ පිළිබඳ ප්‍රමිතියෙහි 42 වැනි ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගැලපීම් සිදු කිරීමෙන් තොරව පෙර කාලපරිච්ඡේදවලට අදාළව රු.මිලියන 7.39 ක් වූ ඇතැම් පරිපාලන හා සෘජු වියදම් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන්ම අඩු වී තිබුණි. | දැනටමත් සෘජු වියදම් සඳහා පමණක් ගැලපීම් සිදු කර ඇති අතර පරිපාලන වියදම් සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. සෘජු වියදම් යටතේ, සටහන අංක 22 හි විස්තර කර ඇති පරිදි ගැලපීම් සිදු කරන ලදී. | 1. ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධාන අනුව පෙර කාලපරිච්ඡේදයේ දෝෂ හඳුනාගෙන වාර්තා කළ යුතුය.<br><br>2.විගණන නිරීක්ෂණයට අදාළව කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 16 - දේපල, පිරියත සහ උපකරණ ප්‍රමිතයෙහි 51 ඡේදය අනුව - සමාගම විසින් භාවිතා කරනු ලබන රු.මිලියන 79.5 ක ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය ඇතුළුව රු.මිලියන 100.08 ක සම්පූර්ණ ක්ෂය වූ වත්කම්, එම වත්කම්වල සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කරගෙන යාම සඳහා පියවර ගෙන ඇත.<br>. | ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ | සමාගම ගලිගමුව ඉඩම සඳහා 2017 ජූලි 07 දින සිට වසර 35කට බදු ගිවිසුමකට එළැඹ තිබුණද, කල්බදු පිලිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතය (SLFRS) – 16 ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල එම කල්බදුවට අදාළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය සහ බදු වගකීම් හඳුනාගෙන නොතිබුණි. | මෙම දෝෂය හඳුනාගෙන ඇති අතර ඒ අනුව ලබන වසරේදී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත - 16 ට අනුව නිවැරදි කරනු ලැබේ. | -එම- |

**1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගලිගමුව ඉඩම සඳහා වසර 5ක සහන කාලයක් සහිතව 2017 ජූලි 07 වැනි දින එළැඹුණු කුලී ගිවිසුමට අනුව සමාගමට 2022 ජූලි 07 සිට 2023 ජූලි 06 දක්වා කාලය සඳහා 2023 ජූලි 07 හෝ ඊට පෙර කුලිය ගෙවීමට සිදුව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මාස හයක කාලයට අදාළව රු.118,000 ක කුලී වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මෙම දෝෂය හඳුනාගෙන ඇති අතර 2017 සිට 2022 දක්වා 1 වන ගෙවීම 2023 දී අවසන් කර ඇත. ඒ අනුව ගැලපීම සිදු කරනු ලැබේ. | සියලුම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතුය. |
| (ආ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට තොගය රු.මිලියන 39.22 කි. මෙම ශේෂය වසර අවසන් වූ දිනට පසු දිනක බර තැබූ සාමාන්‍ය පිරිවැය භාවිතා කර පද්ධතිය විසින් ලබා දී ඇති වටිනාකම වූ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති තොග ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | ERP Cloud පද්ධතිය යටතේ තොග තක්සේරුව බර තැබූ සාමාන්‍ය පිරිවැයට සිදු කරයි. ඒ අනුව තොග අයිතමයක ඒකක මිල තොගයේ චලනයන් අනුව වෙනස් වේ. | තොග වඩාත් නිවැරදිව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.1.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට පුද්ගලික වාණිජ බැංකුවකින් ලබාගත් කාලීන ණය ශේෂ 06ක මුළු එකතුව රු.මිලියන 80.86ක් වූ අතර ශේෂ තහවුරු කිරීමට අනුව ණය ශේෂය රු.මිලියන 87.65 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සහ ශේෂ තහවුරු කිරීම් අතර රු.මිලියන 6.78 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස හඳුනාගෙන ඇති අතර දැනට සැසඳුම් ක්‍රියාවලිය යටතේ පවතී. | බැංකු තහවුරු කිරීම් සමඟ ශේෂයන් සැසඳීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු රු.මිලියන 30.77 ක් වූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ ආදායම් බදු වාර්තා අනුව (2020/2021 තක්සේරු වර්ෂය දක්වා) එම කාලයට අදාළව ගෙවිය යුතු ආදායම් බදු රු.මිලියන 15.2 ක් විය. ඒ අනුව රු.මිලියන | පෙර වර්ෂවලට අදාලව ප්‍රතිපාදන වෙනසක් සිදු කරන ලද ආදායම් බදුවලට අදාළ හිඟ ආදායම් බදු වාර්තා ගොනු කිරීම 2023 අප්‍රේල් මාසයේදී අවසන් | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් සටහන් කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| 15.57 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කර නොතිබුණි. | කරන ලදී. ආදායම් බදු වාර්තාවලට අනුව මූල්‍ය ගැලපීම ඉදිරියේදී සිදු කෙරේ. | |

### 1.5.1.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවිය යුතු ආදායම් බද්දට එරෙහිව සමාගම විසින් රු.මිලියන 2.12 ක් වූ ලැබිය යුතු දිගුකාලීන රඳවා ගැනීමේ බදු (WHT) ශේෂය හිලව් කරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, රඳවා ගැනීමේ බදු සහතික විගණනය සඳහා ලබා දී නොතිබුණි. | රඳවාගැනීමේ බදු සහතිකය විගණනයට භාර දෙන ලදී. | අයිතිවාසිකම් කිව හැකි ශේෂයන් හැකිතාක් අයකර ගැනීමට සහ ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ණය පොලී වියදම රුපියල් මිලියන 18.46 කි. කෙසේ වෙතත්, ණය ආපසු ගෙවීම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු විගණනයට ලබා දී නොතිබූ බැවින්, ඉහත පොලී වියදමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කර ගැනීමට නොහැකි විය. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොතිබුණි. | ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මව් ආයතනය වන - ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වෙතින් ලැබිය යුතු ශේෂය රු.මිලියන 165.31 ක් වුවද ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඊට අනුරූප ශේෂය රු.මිලියන 28.21 ක් වූ බැවින් රු.මිලියන 137.1 ක වෙනසක් නිරීක්ෂණය විය. | ලංකා විදුලිබල මණ්ඩලයේ පොත් තබන්නන්ගේ දෝෂයක් බැවින් අදාළ තොරතුරු ඉදිරිපත් කරන්නේ නම් ලැබිය යුතු ශේෂයන් තහවුරු කළ හැකිය. | වෙනස්කම් සැසඳීමට සහ සම්බන්ධිත පාර්ශ්වයන් වෙතින් ලැබිය යුතු ශේෂයන්හි විෂමතාවයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

#### (ආ) ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2019 වසරේ සිට එකතුවී ඇති සහ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ පෙන්වා ඇති රු.මිලියන 7.06 ක හඳුනා නොගත් තැන්පතු හඳුනා ගැනීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ශේෂයෙන් අඩක් දැනටමත් නිරවුල් කර ඇත. ඒ අනුව ඊආර්පි පද්ධතිය යාවත්කාලීන කෙරේ. | හඳුනා නොගත් තැන්පතු හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු ශේෂය රු.මිලියන 43.88 ක් වූ අතර, 2015/2016 තක්සේරු වර්ෂයේ සිට සමාගම ආදායම් බදු ගෙවා නොතිබුණි. | ආදායම් බදු වාර්තා පිරවීමේ පසු සටහන 2023 අප්‍රේල් මාසයේදී අවසන් කරන ලද අතර මීට පෙර ප්‍රතිපාදන පමණක් සිදු කරන ලදී. මේ වන විට ආදායම් බදු වාර්තාවලට අනුව මූල්‍ය කටයුතු සකස් කෙරේ. | ප්‍රමාදයකින් තොරව බදු පියවීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ශේෂය රු.595,036 ක් වූ අතර මෙම ශේෂය 2015/2016 තක්සේරු වර්ෂයට අදාළ විය. කෙසේ වෙතත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනය වන විටත් සමාගම එම ශේෂය පියවා නොතිබුණි. | මෙය පරීක්ෂා කර පියවනු ලැබේ. | -එම- |

**1.5.1.6 මව් ආයතනය විසින් සපයනු ලබන අතිරේක ප්‍රාග්ධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා විදුලිබල මණ්ඩලයෙන් (CEB) රු.මිලියන 20 ක අමතර ප්‍රාග්ධනයක් පෙර වසරවලදී ලැබී තිබුණු අතර එම මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් යටතේ "කොටස් ඉල්ලුම්පත්‍ර මුදල්" ලෙස ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම ශේෂය කොටස් නිකුත් කිරීමකින් තොරව සැලකිය යුතු කාලයක සිට නොවෙනස්ව පැවතුනි. | මෙම කාරණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර රු.මිලියන 20ක කොටස් ඉල්ලුම්පත්‍ර මුදල් සඳහා කොටස් නිකුතුවක් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාට උපදෙස් දෙන ලදී. | ලංකා විදුලිබල මණ්ඩලයට කොටස් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

සීමාසහිත දැදුරු ඔය මිනි හයිඩ්‍රෝ (පුද්ගලික) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශ කර තිබූ අතර පහත සඳහන් නිරීක්ෂණ මත පදනම්ව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කළ විගණන මතයක් මා විසින් ප්‍රකාශ කර තිබුණි.

**1.5.2.1 සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු VAT බදු සහ NBT පිළිවෙලින් රු.මිලියන 11.91 ක් සහ රු.මිලියන 10.74 ක් විය. කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සෘජුවම ලබා ගත් තොරතුරු වලට අනුව, එම දිනය | සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම 2019.12.01 සහ 2020.01.01 සිට NBT සහ VAT යටතේ බදු බැඳියාවක් නොමැත. NBT සහ VAT සඳහා ගෙවිය යුතු | මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වන විට මුළු VAT බදු සහ NBT වගකීම් පිළිවෙලින් දඩ මුදල් ද සමඟ රු.මිලියන 44.80 ක් සහ රු.මිලියන 17.33 ක් විය. ඒ අනුව, VAT සහ NBT වගකීම් වල එකතුව පිළිවෙළින් රු.මිලියන 32.89 සහ රු. මිලියන 6.58 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂයන් ඉහත ලියාපදිංචිය ඉවත් කිරීමට පෙර පැවති කාල සීමාවට අදාළ වේ. දැනට ගෙවිය යුතු VAT බදු ශේෂය මාසික පියවීම් යටතේ පියවා ඇත. සමාගම NBT පියවීමට කටයුතු කරන අතර ඒ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැනටමත් එකඟ වී ඇත. | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු විකුණුම් බදු ශේෂය (ලංවිම මගින් එකතු කරන ලද අතිරික්ත වැට් බද්ද) රු.මිලියන 11.79 කි. කෙසේ වෙතත්, මෙම ශේෂය ලංවිම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. තවද, එම ශේෂය සත්‍යාපනය කිරීම සඳහා ප්‍රමාණවත් අදාළ තොරතුරු සමාගම විසින් සපයා නොතිබූ අතර, මෙම ගෙවිය යුතු ශේෂය වසර පහකට වැඩි කාලයක සිට සමාගම විසින් පියවීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. | ගෙවිය යුතු ශේෂය පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වෙළඳ ලැබිය යුතු දෑ ලෙස එකතුව රු.මිලියන 9.39 ක ශේෂයක් සටහන් කර තිබූ අතර එම ශේෂය විදුලිබල මණ්ඩලයේ පොත්වල දක්වා නොතිබුණි.. | විගණන කමිටුවේ සහය ඇතිව එකී ශේෂයන් කපා හැරීමට කටයුතු කරනු ඇත. | 1. සමාගම ලංකා විදුලිබල මණ්ඩලය සමඟ වෙළඳ ලැබිය යුතු ශේෂය සැසඳීම කළ යුතුය.<br>2. ශේෂය කපා හැරීමට පෙර, ගැඹුරු පරීක්ෂණයක් කළ යුතුය. |

**1.5.2.2 සීමාසහිත කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ (පුද්ගලික) සමාගම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම 2015 පෙබරවාරි 18 දින සිට වසර 20 ක කාලයක් සඳහා කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම, හිමිකාරිත්වය දැරීමට සහ පවත්වාගෙන යාම සඳහා ඉඩමක් බදු පදනම මත ලබා ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වෙතත්, SLFRS 16 - කල්බදු ප්‍රමිතය ප්‍රකාරව වත්කම් | සියලුම මිනි හයිඩ්‍රෝ බලශක්ති සංවර්ධකයින් සඳහා ලබා දී ඇති සහනය අනුව, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉඩම් බදු දීම සඳහා විශේෂිත සහනය ලබා ගැනීමට සහ මූල්‍ය සංශෝධනය කිරීමට | ගිණුම්කරණ ප්‍රමිතියේ ප්‍රතිපාදනවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාවිතා කිරීමේ අයිතිය, කල්බදු වගකීම සහ බලපත්‍ර ගාස්තු මත බදු ගෙවීම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | සමාගම ක්‍රියා කරනු ඇත. SLFRS 16 මත පදනම්ව සමාගම යෝජිත සංශෝධනවලට අනුගත වනු ඇත. | |
| (ආ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 සිට 2022 දක්වා කාලය සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවට 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව රු.මිලියන 24.38 ක් වූ අතර වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු මත විගණනය මගින් වාර්ෂික ගාස්තු (වැට් බද්ද සමඟ) ගණනය කිරීම අනුව, එම ශේෂය දළ වශයෙන් රු. මිලියන 25.71 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සහ විගණනය මගින් සිදු කරන ලද ගණනය කිරීම් අතර ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවේ රු.මිලියන 1.31 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස පරීක්ෂා කර ඒ අනුව සකස් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් සටහන් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 ජනවාරි 10 දිනැති ලිපියට අනුව, වාර්ෂික ගාස්තුව නොගෙවීම හේතුවෙන් 2017 සිට 2021 දක්වා කාලය සඳහා රු.මිලියන 1.78 ක වාර්ෂික ගාස්තු සඳහා කල් ඉකුත් වූ පොලියක් දෙපාර්තමේන්තුව විසින් අය කර ඇත. කෙසේ වෙතත්, එය සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම හෝ අනාවරණය කිරීම සිදු කර නොතිබුණි. | නිවැරදි වටිනාකම උපචිත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගනුදෙනු නිසි ලෙස සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්වල වෙනස්කම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 08 ) 42 (අ) සහ (ආ) ඡේදයට අනුව, 2019 වසරේ සිට 2021 වසර දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට (BOI) ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව රු.මිලියන 4.6 ක් සමාගම විසින් 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂයේ ගැලපීම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 ඔක්තෝම්බර් 05 දින දැනුම්දීම මත පදනම්ව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා වාර්ෂික ගාස්තුව නිශ්චිත වර්ෂය අනුව වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර, වර්ෂය අනුව හඳුනා ගත් වියදම් සඳහා මේ වන විටත් ගැලපීම් සිදු කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියේ ප්‍රතිපාදනවලට අනුකූල විය යුතුය. |
| (ඉ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට (BOI) වෙත ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව රු.මිලියන 10.52 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ශේෂය පියවීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.තවද, BOI විසින් 2022 ඔක්තෝම්බර් 05 දිනැති ලිපිය මඟින් හිඟ මුදල් සම්බන්ධව දක්වා ඇති තොරතුරු අනුව, 2018 සිට 2022 | බලශක්ති සැපයුම සඳහා ලංවිම වෙතින් ලැබිය යුතු මුදල් නොලැබීම හේතුවෙන් ආයෝජන මණ්ඩලයේ ගාස්තු පියවීමට සමාගම සතුව යහපත් මූල්‍ය තත්වයක් නොපවතී. දැනට සමාගම මෙම දඩ | නියමිත ශේෂයන් පියවීමට සහ මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගනුදෙනු නිසි ලෙස සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| දක්වා කාලය සඳහා කල් ඉකුත් වූ පොලිය දළ වශයෙන් රු.මිලියන 11.73 කි.කෙසේ වෙතත්, සමාගම මූල්‍ය ප්‍රකාශනවල මෙම කල් ඉකුත් වූ පොලිය හඳුනා ගැනීම හෝ හෙළිදරව් කිරීම කර නොතිබුණි. | පොලී ගාස්තු අඩු කිරීම සඳහා BOI සමඟ සාකච්ඡා කරමින් සිටින අතර, ගැටලුව සම්පූර්ණයෙන් විසඳන තුරු එම පොළිය ගිණුමට උපචිත කෙරේ. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.2.5 (අ) ඡේදය. | ලාභාංශ, හිමිකම් හා කොටස් හිමිකාරිත්වයේ වෙනස්කම් සහ ප්‍රධාන ගනුදෙනු ඇතුළු ගැටළු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උප සමාගම් සඳහා වූ ප්‍රතිපත්තියක් තිබීම අනිවාර්ය වේ. කෙසේ වෙතත්, සමාගම එවැනි ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. | මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කෙරේ. | රජය සතු ව්‍යාපාර සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය. |

**1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 33.3 (ii) වගන්තියට අනුව සහ 2022 දෙසැම්බර් 15 දිනැති අංක පීඑන්/අයිටී/2022-03 දරන බදු ගෙවන්නන්ට දැනුම් දීමෙහි 3 වැනි ඡේදය අනුව, ආදායම් බදු ගණනය කිරීම සමානුපාතික පදනමට අනුව සකස් කළ යුතු අතර පළමු මාස 6 සඳහා සියයට 24 ක සහ ඉතිරි මාස 6 සඳහා සියයට 30 ක අනුපාතයක් යෙදිය යුතුය. කෙසේ වෙතත්, සමාගම 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා සියයට 24 ක අනුපාතය මත ආදායම් බදු ගණනය කිරීම් සකස් කර තිබුණි. | මෙය පරීක්ෂා කර ඒ අනුව ගැලපීම් සිදු කරනු ලැබේ. | දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 64.34 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 119.48 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 55.44 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විදේශ විනිමය අලාභය හේතුවෙන් මූල්‍ය වියදම් ඉහළ යාම සහ පරිපාලන වියදම් සහ ඍජු ව්‍යාපෘති වියදම් (ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණය) වැඩිවීම ප්‍රධාන හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් පෙර වර්ෂය හා සසඳන විට වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ විශ්ලේෂණය පහත දැක්වේ.

| ආදායම් / වියදම් | 2022 රු. මිලියන | 2021 රු. මිලියන | වැඩිවීම/(අඩුවීම) රු. මිලියන | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ආදායම | 757.87 | 711.01 | 46.86 | 6.59 |
| විකුණුම් පිරිවැය | 444.72 | 462.91 | (18.20) | (3.93) |
| ඍජු ව්‍යාපෘති වියදම් | 5.35 | 0.72 | 4.63 | 638.21 |
| පරිපාලන පිරිවැය | 101.11 | 81.17 | 19.94 | 24.57 |
| මූල්‍ය වියදම් | 150.24 | 49.56 | 100.68 | 203.15 |
| මූල්‍ය ආදායම | 6.86 | 2.51 | 4.36 | 173.94 |

## 2.3 අනුපාත විශ්ලේෂණය

පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ ප්‍රධාන අනුපාත පහත පරිදි වේ.

| අනුපාත | 2022 | 2021 |
|---|---|---|
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය (%) | 19.32 | 20.13 |
| දළ ලාභ අනුපාතය (%) | 41.32 | 34.89 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 8.49 | 16.84 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1: 1 | 1: 0.87 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 1: 0.92 | 1: 0.65 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි (පුද්ගලික) සමාගමට මීටර් ආවරණ නිෂ්පාදනය කර සැපයීමේ ව්‍යාපාරයක නිරත වුවද විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, පාර්ශව දෙකක් අතර කිසිදු ව්‍යාපාරික ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට එළඹී නොතිබුණි. | මෙය ආයතනගත ව්‍යාපාර කටයුත්තක් වන අතර ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය ගෙන ඍජුවම මිලදී ගැනීමට පවරා දෙන ලදී. | ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සමාගම සහ අදාළ පාර්ශ්ව අතර ගිවිසුමක් ඇති කර ගත යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විකුණුම් මත නිමැවුම් වැට් බදු ශේෂය රු.මිලියන 55.08 ක් විය. කෙසේ වෙතත්, සමාගම 2018 වසරේ සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වැට් බද්ද ප්‍රේෂණය කර නොතිබුණි. තවද, සමහර වැට් බදු වාර්තා විගණනයට ලබා දී නොමැති බැවින් එම වැට් බදු ප්‍රමාණයේ නිරවද්‍යතාවය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | 2023 වර්ෂයේ සිට දැනට පවතින මුදල් ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව මේ වන විට සමාගම විසින් ඉහත සඳහන් කළ වැට් බදු ගෙවිය යුතු වටිනාකමින් සමාගම රු. මිලියන 4ක් පියවා ඇත. | ප්‍රමාදයකින් තොරව බදු පියවීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් 2012 ජුලි 27 වැනි දින සීමාසහිත ඇම්ට්‍රාඩ් හොල්ඩිංස් (පුද්ගලික) සමාගම (Amtrad Holdings (Private) Limited) සමඟ හමන අළු සහ යබොර භාවිතයෙන් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සහ විකිණීම සඳහා කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා හවුල් ව්‍යාපාරයකට එළැඹී අතර මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාගම 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7.36 ක මුදලක් ආයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, හවුල් ව්‍යාපාර ගිවිසුම 2014 මාර්තු 27 වන දින කළමනාකාරිත්වය විසින් අවසන් කර ඇති අතර ව්‍යාපාරික හවුල්කරුවෙකු නොමැති වීම හේතුවෙන් වත්කම් අක්‍රියව පැවතුනි. සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම වත්කම් 2016 දී ලංකා විදුලිබල මණ්ඩලය වෙත පැවරීමට තීරණය කර තිබුණද වත්කම් ලංකා විදුලිබල මණ්ඩලයට පැවරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳව ප්‍රමාණවත් සහ සුදුසු සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.<br>තවද, තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවට අනුව, 2019 මැයි 31 වන විට දේපල තක්සේරුව රු.මිලියන 2.66 ක් ලෙස පෙන්වා ඇති අතර එකී තක්සේරුව මත පදනම්ව 2019 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජනයේ වටිනාකම හානිකරණය කර තිබුණු අතර එම හානිකරණය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනයට ලබා දී නොතිබුණි. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ACM කමිටුව විසින් පනවන ලද අවශ්‍යතාවය මත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් මෙම අළු-ගඩොල් ආයෝජනය පිළිබඳ සවිස්තරාත්මක ඇගයීමක් සිදු කර ඇත. | අභ්‍යන්තර විගණන වාර්තාවේ නිර්දේශ සලකා බලා මේ සම්බන්ධයෙන් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල අංක 2.3 ඡේදයට අනුව, අනුබද්ධ ආයතන විසින් අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ මව් සමාගමට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කර ලංකා විදුලිබල මණ්ඩලයට (මව් සමාගම) ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම නිම කරමින් පවතී. සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සඳහා 2022 වර්ෂයේ අයවැය සකස් කරන ලදී. | ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය. |

**4.2 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ (එස්ඩීජී) "2030 න්‍යාය පත්‍රයට" අනුකූලව, සිය විෂය පථය යටතේ අරමුණු හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සියලු රාජ්‍ය ආයතන දායක විය යුතුය. නමුත් අදාළ අරමුණු සහ සාක්ෂාත් කරගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ පරතරයන් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක සමාගම හඳුනාගෙන නොතිබුණි. | මෙම හොඳම පරිචය පිළිපදිනු ඇත. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූල විය යුතුය. |